# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1814/58 - 2013 ජුනි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : හාප/සං/2/ඉඅ/83.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය : 4/3/3/2011/WS/36.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ, කොණ්ඩදෙනිය ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද, 2013.05.18 දිනැති අංක මහ 6262 දරන මූලික පිඹුරේ කැබලි අංක 1, 2 හා 3 වශයෙන් දැක්වෙන “ ඩිංගිරියාදෙනිය” නැමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0703 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන :

**1. කැබලි අංක 1; ඉඩමේ නම: ඩිංගිරියාදෙනිය; ප්‍රමාණය: හෙක්. 0.0221**

*මායිම්:*

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය (ප්‍රාදේශීය සභා), මාර්ගය සහ ඇළ; |
| *නැගෙනහිරට* | : | මාර්ගය සහ ඇළ; |
| *දකුණට* | : | මු. පි. මහ 5398 හි කැබලි අංක 26 සහ මෙම පිඹුරේ කැබලි අංක 2; |
| *බටහිරට* | : | කැබලි අංක 2, මාර්ගය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා). |

*හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්:*

1. විහාරාධිපතින් වහන්සේ, වළල රජමහා විහාරය, මැණික්හින්න.
2. මහා භාරකාරතුමා, මහා භාරකාර දෙපාර්තමේන්තුව, කොළඹ 07.

**02. කැබලි අංක 2; ඉඩමේ නම: ඩිංගිරියාදෙනිය; ප්‍රමාණය: හෙක්. 0.0004**

මායිම්:

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය සහ කැබලි අංක 1; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 1 සහ මු. පි. මහ 5398 හි කැබලි අංක 26; |
| *දකුණට* | : | මු. පි. මහ 5398 හි කැබලි අංක 26 ; |
| *බටහිරට* | : | මු. පි. මහ 5398 හි කැබලි අංක 26 සහ මාර්ගය. |

*හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්:*

1. විහාරාධිපතින් වහන්සේ, වළල රජමහා විහාරය, මැණික්හින්න.
2. මහා භාරකාරතුමා, මහා භාරකාර දෙපාර්තමේන්තුව, කොළඹ 07.

**03. කැබලි අංක 3; ඉඩමේ නම: ඩිංගිරියාදෙනිය; ප්‍රමාණය: හෙක්. 0.0478**

මායිම්:

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. මහ 5398 හි කැබලි අංක 26 ; |
| *නැගෙනහිරට* | : | මු. පි. මහ 5398 හි කැබලි අංක 26, වළල රජමහා විහාරය හිමිකම් කියන ඩිංගිරියාදෙනිය සහ අඩි පාර; |
| *දකුණට* | : | වළල රජමහා විහාරය හිමිකම් කියන ඩිංගිරියාදෙනිය, අඩි පාර සහ මු. පි. මහ 5398 හි කැබලි අංක 26; |
| *බටහිරට* | : | මු. පි. මහ 5398 හි කැබලි අංක 26. |

*හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්:*

1. විහාරාධිපතින් වහන්සේ, වළල රජමහා විහාරය, මැණික්හින්න.
2. මහාභාරකාරතුමා, මහා භාරකාර දෙපාර්තමේන්තුව, කොළඹ 07.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 අගෝස්තු මස 14 වැනි දින පෙ. ව. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 අගෝස්තු මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ආර්. එම්. පී. එස්. බී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2013 ජුනි මස 11 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නුගවෙල.

06 - 768

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය:- හා/5/4/2/37.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:- LD/05/2007/E/197.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනිපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, ඇටම්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2013.05.07 දිනැති අ. ග. පි. 197 අංක 28 අතිරේක අංක 29 පත්‍ර අංක 34 දරන පිඹුරේ කැබලි අංක "ඒ" වශයෙන් දැක්වෙන "දියබෙලතැන්න" නමැති ඉඩමේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0585ක් පමණක් වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**1. කැබලි අංක "ඒ"; ඉඩමේ නම: දියබෙලතැන්න; ප්‍රමාණය: හෙක්. 0.05858**

මායිම්:

| | | |
|---|---|---|
| *උතුරට* | : | දියබෙලතැන්න පාසල් වත්ත බ/ඇටම්පිටිය ජාතික පාසල සහ දියබෙලතැන්න වත්ත, සරත් කුමාරනායක; |
| *නැගෙනහිරට* | : | දියබෙලතැන්න වත්ත සරත් කුමාරනායක සහ දියබෙලතැන්න වත්ත ඒ. එම්. වික්‍රමසිංහ; |
| *දකුණට* | : | දියබෙලතැන්න වත්ත ඒ. එම්. වික්‍රමසිංහ, මාර්ගය සහ දියබෙලතැන්න වත්ත වයි. ජී. සුගතපාල; |
| *බටහිරට* | : | දියබෙලතැන්න පාසල් වත්ත බ/ ඇටම්පිටිය ජාතික පාසල. |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි බලයලත් අයවලුන් හෝ 2013.07.04 වැනි දින පෙ. ව. 10.00ට හාලිඇල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2013.06.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්ලිව්. එම්. ආර්. රංජිත්,
ප්‍රාදේශීය ලේකම්,
හාලි ඇල.

2013 ජුනි මස 11 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 769

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.